වෙළුම V - කලාපය II / 2023 / ISSN 2820-2023

# පවුලෝ ෆ්‍රෙයර්ගේ අධ්‍යාපන දර්ශනය

එච්.එම්. සඳලි සත්මා ඉලංගකෝන්

## හැඳින්වීම

විසි එක්වන සියවසේ අධ්‍යාපනය සම්බන්ධ කථිකාවත ආරම්භ වී තුන්වන ශතකය ගෙවෙමින් තිබුණ ද තවමත් වේගවත් තාක්ෂණික දියුණුව, සංස්කෘතිකත්වය හා බැඳි ගෝලීයකරණය සහ ශ්‍රම වෙළඳපොලෙහි දායකත්වය දිනෙන් දින වර්ධනය වෙමින් පවතී. නමුත් තවමත් බොහෝ රටවල් මෙම ගතිකත්වය පසෙකලමින් සාම්ප්‍රදායිකත්වය සමඟ අත්වැල් බැඳගෙන ඇත. එසේ ම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා බලපාන කුසලතා, අවබෝධය, සදාචාරය, ආකල්ප යනාදී බහුවිධ ගුණාංග සංවර්ධනය ද මේ හේතු මත තවමත් අපේක්ෂිත මට්ටම් කරා ළගා වී නොමැත. කෙසේ වෙතත් මෙම එකදු ගුණාංගයකදු කටපාඩම් කිරීම, ධූරාවලිගත අධ්‍යාපනය හෝ අධිකාරීත්ව අධ්‍යාපන ශෛලීන් යන යල් පැනගිය සාම්ප්‍රදායික අධ්‍යාපන පද්ධති හරහා සංවර්ධනය කළ නොහැක. එහි දී සිදුවන ප්‍රධානම කාරණාව නම් ශිෂ්‍යයා නිෂ්ක්‍රීය දැනුම ලබන්නෙකු බවට පත්වීමයි. ඒ නිසා මේ වෙනුවට ගුරු සිසු දෙපාර්ශවයම සජීවී සහ සක්‍රීය සහභාගිත්වය සහිත එදිනෙදා ලෝකය හා ප්‍රායෝගිකව සන්නද්ධ විය හැකි මිත්‍රශීලී, මනා සන්නිවේදනයක් සහිත සහයෝගී ඉගෙනුම් ප්‍රවේශයක් අවශ්‍ය වේ.

මෙහි දී අධ්‍යාපනයේ පරිවර්තනීය වෙනසක් සඳහා පවුලෝ ෆ්‍රෙයර්ගේ අධ්‍යාපන දර්ශනය මහෝපකාරී වේ. විචාරශීලි චින්තනය (Critical Thinking), සංවාදය (Dialogue) සහ ක්‍රියාව (Action) යන ත්‍රිත්ව සංකල්පය කෙරෙහි ප්‍රධාන අවධානය යොමු කරන ඔහු සාම්ප්‍රදායික අධිකාරිවාදී අධ්‍යාපනික ක්‍රම සඳහා ප්‍රබල විකල්පයන් ඉදිරිපත් කරයි. ඒ අනුව මෙම ලිපිය ෆ්‍රෙයර්ගේ අධ්‍යාපන දර්ශනය, සාම්ප්‍රදායික අධ්‍යාපනය අතික්‍රමණය කරමින් විසිඑක්වන සියවසෙහි කුසලතා පෝෂණය කිරීමට පදනම් වන ආකාරය පිළිබඳව සොයා බලනු ලැබේ.

**සාකච්ඡාව**

බ්‍රසීලියානු අධ්‍යාපනඥයකු සහ දාර්ශනිකයකු වන පවුලෝ ෆ්‍රෙයර් (1921-1197) අධ්‍යාපනයේ වඩාත්ම බලගතු චින්තකයන්ගෙන් එක් අයෙකු ලෙස සැලකෙයි. 1921 වර්ෂයේ සැප්තැම්බර් 19 වන දින උපත ලද මොහු මධ්‍යම පාන්තික පවුලක හැදී වැඩුනමුත් 1930 දී පමණ ඔහුගේ පියා මියයාමත් සමඟ දරිද්‍රතාවය සහ කුසගින්න ඉදිරියේ අනේකවිධ අභියෝගයන්ට මුහුණ දීමට සිදුව ඇත. නමුත් නෙල්සන් මැන්ඩෙලාගේ (2003) ප්‍රසිද්ධ උපුටා දැක්වීමක් වන ''ලෝකය වෙනස් කිරීමට භාවිත කළ හැකි බලවත්ම ආයුධය අධ්‍යාපනයයි'' යන ප්‍රකාශය නැවත වරක් නිවැරදි කරමින් ෆ්‍රෙයර් නැගී සිටියේ ය (www.nelsonmandela.org). එනම් ඔහු විසින් මුහුණපාන්නට යෙදුණු ඒ සියලු අභියෝග තම ජීවිතයට පැමිණි ආශිර්වාද සේ සලකමින් අධ්‍යාපනයේ නවමු මුහුණුවරක් නිර්මාණය කරන්නට ඔහු සමත් වීය. දරිද්‍රතාව සමග වර්ධනය වූ නූගත්කම සහ මේ හේතුවෙන් අධ්‍යාපනය හා ගොඩනැගුණු අසමානතාව පිළිබඳ ඔහුගේ අවධානය යොමුවිය.

ෆ්‍රෙයර්ගේ අධ්‍යාපන දර්ශනය තුළ අවධානය යොමු වූ ප්‍රධාන අංශ තුනක් හඳුනාගත හැක.

- විචාරශීලි චින්තනය (Critical Thinking)
- සංවාදය (Dialogue)
- ක්‍රියාව (Action)




Figure 1: ෆ්‍රෙයර්ගේ අධ්‍යාපන දර්ශනය තුළ අවධානය යොමු වූ ප්‍රධාන අංශ තුන

## විචාරශීලි චින්තනය

විචාරශීලි චින්තනය යනු ගැටලුවක් හෝ ප්‍රශ්නයක් පුද්ගලානුබද්ධ කරගැනීමකින් තොරව එය විවිධාකාර පැතිකඩ ඔස්සේ බලමින් විග්‍රහ කර ගැනීමේ සහ යම් විනිශ්චයන්ට එළඹීමේ හැකියාව ලෙස සරලව අර්ථකථනය කළ හැක. මේ හා සමානව අදහස් දක්වමින් ෆ්‍රෙයර් දක්වා සිටින්නේ ද විචාරශීලි චින්තනය යනු තොරතුරු නිෂ්ක්‍රීය අන්දමින් පිළිගැනීමට වඩා ඒවා ප්‍රශ්න කිරීමට, විශ්ලේෂණය කිරීමට සහ අභියෝග කිරීමට ඇති හැකියාව ලෙස ය. එසේ ම ඔහු එය ඉගෙනගන්නන් සඳහා ස්වාධීනව සිතීමට උපකාරී වන වැදගත් ප්‍රවේශයක් බව ද දක්වා ඇත (ෆ්‍රෙයර්, 1987). මෙම ප්‍රවේශයේ දී ඔහු විසින් ප්‍රධාන අංශ තුනක් පිළිබඳව අවධානය යොමු කර ඇත.

1. කරුණු කටපාඩම් කිරීම වෙනුවට දේවල් සිදුවන ආකාරය විමර්ශනය කිරීම සහ ලෝකය සමඟ ප්‍රශ්න කිරීමට ශිෂ්‍යයන්ව යොමු කිරීම

2. සැඟවුණු අසමානතාවයන්ට හා අයුක්තිය වෙනුවෙන් අභියෝග කිරීමට උපකාර කිරීම

3. ඉගෙනීම අනිවාර්යයෙන්ම සැබෑ ජීවිත අත්දැකීම් සමඟ සම්බන්ධ වීම

විසි එක්වන සියවසේ අධ්‍යාපන සංදර්භය තුළදී මූලික ස්ථානයක් හිමිවන මෙම කුසලතාව වත්මන් අධ්‍යාපනයට බෙහෙවින් බලපානු ලබයි. සැබෑ ලෝකයේ ගැටලුවලට විසඳුම් සෙවීමට යාමේ දී බොහෝ සිසුන් සිදු කරන්නේ එකම සුසමාදර්ශයක් ඔස්සේ ගැටලුව දෙස බැලීම ය. නමුත් එය එතරම් සුබදායක දෙයක් නොවේ. උදාහරණයක් ලෙස සාම්ප්‍රදායික පන්ති කාමරය තුළ සිදුවනුයේ බොහෝ විට යම් කිසි සිදුවීමක් ආශ්‍රිත පාඩමක දී එම සිදුවීම සිසුවා විසින් කටපාඩම් කිරීම හා එය එලෙසම නැවත පිටපත් කිරීම ය. නමුත් එම සිදුවීමෙහි ගැඹුර දැකීම, හේතු විමර්ශනය සහ විශ්ලේෂණය, වෙනස්කම් අධ්‍යයනය වැනි තාර්කික පදනමක් මත එය සිදුකරේ වී නම් සිසුවා තුළ චින්තන ශක්තිය වර්ධනය සේම කටපාඩමකට

එහා ගිය විධිමත් මතකයක් මනස තුළ තැන්පත් වනු ඇත. විචාරශීලි චින්තනය හරහා ෆ්‍රෙයර් දක්වා සිටියේ මෙලෙස ඉගෙනීම හැකිතාක් සිසුන්ගේ සැබෑ ජීවිතයට සම්බන්ධ කරමින් ඉගැන්වීමට ගුරුවරුන් විසින් වග බලා ගත යුතු බවයි. ඔහු තම සාක්ෂරතා වැඩසටහනක දී දක්වා සිටියේ සැමදා කටපාඩම් කරමින් ඉගෙන ගන්නා වචන මාලාව වෙනුවට ඔවුන්ගේ දෛනික අරගලවලට අදාළ වචන සාකච්ඡා කිරීම ඔස්සේ (ඉඩම් අයිතිවාසිකම්, ඉඩම් අසමානතා, අසමානතාවයන්ට හේතු සහ ක්‍රියාමාර්ග) දරුවා වඩාත් හොඳින් ඉගෙන ගන්නා බව ය (ෆ්‍රෙයර්, 1987).

**සංවාදය**

සංවාදය යනු අධ්‍යාපනයේ මූලික පදනමක් බව ෆ්‍රෙයර් දක්වා සිටියේ ය. එහිදී ඔහු සංවාදයකින් තොරව සන්නිවේදනයක් නොමැති බවත් සන්නිවේදනයකින් තොරව සැබෑ අධ්‍යාපනයක් තිබිය නොහැකි බවත් ප්‍රකාශ කරන ලදි (ෆ්‍රෙයර්, 1968). වත්මන් අධ්‍යාපන සන්දර්භය තුළ හුදෙක් සිදු වන්නේ ගුරුවරයා මූලික වූ නොහොත් ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් තුළ හිස් භාජන පුරවන්නාක් සේ සිසුන්ගේ මොළය තුළ දැනුම තැන්පත් කිරීම ය. නමුත් විසි එක්වන සියවසේ අධ්‍යාපනය අවධානය යොමු කරනුයේ ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාව ඔස්සේ යමින් ගුරු සිසු දෙපාර්ශවයේ ම සක්‍රීය සහභාගිත්වයක් ඉගෙනුම් පරිසරය තුළ ප්‍රවර්ධනය කිරීමට ය. එහිදී සන්නිවේදනය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව අධ්‍යාපනික ගුණාංග සියල්ලම එක්තැන් කරවන අලවනය හෙවත් මැලියම ලෙසින් ක්‍රියා කරන්නේ සන්නිවේදනයයි (අබේපාල, 2022).

ෆ්‍රෙයර් විසින් ගුරුවරයකු විසින් හුදෙක් සිසුන් තුළ දැනුම තැන්පත් කිරීම නොව ඒ වෙනුවට සංවාදය, ප්‍රශ්න කිරීම සහ අත්දැකීම් හුවමාරුව යන විවිධාකාරයේ සන්නිවේදන විධික්‍රම හරහා අධ්‍යාපනය ලබා දිය යුතු ය යන්න අවධාරණය කර ඇත (රුබේරු, 1987). එහිදී ඔහු විසින් අවධානය යොමු කරනු ලැබූ අංශ ත්‍රිත්වයකි. එනම්,

1. ගුරුවරයා සහ සිසුවා අතර සිදුවන අන්‍යෝන්‍ය සන්නිවේදන හුවමාරුව තුළදී දෙදෙනාම ඉගෙනුමක් ලබයි

2. ඉගෙනුම් ක්‍රියාවලිය තුළදී සංවාදය හරහා ගෞරවය, සවන් දීම සහ සහයෝගීතාවය යන විවිධ ගුණාංග සංවර්ධනය

3. සංවාදය සිසුන්ට සැබෑ ජීවිත අත්දැකීම් සමග සම්බන්ධ වීමට සහ විවේචනාත්මක චින්තනය වර්ධනයට උපකාර කරනු ලබයි

විසි එක්වන සියවසේ අධ්‍යාපන කථිකාවතේ දී ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් (WHO) ප්‍රවර්ග කරනු ලැබූ ජීවන කුසලතා අතරට සන්නිවේදන කුසලතාව ද අයත් වනු ලබයි. ඊට අනුව සන්නිවේදනය ප්‍රධානතම පුද්ගලාන්තර කුසලතාවයක් වන අතර මෙය සංවර්ධනය සමාජය තුළ පිළිගත් පුද්ගලයෙකු බවට පත් කිරීමට ඇති හැකියාව ප්‍රවර්ධනය කරනු ලබයි (www.who.int). ඒ අනුව ෆ්‍රෙයර් විසින් සන්නිවේදනය පිළිබඳ දක්වනු ලැබූ කරුණු අධ්‍යාපන ක්‍රමය කෙරෙහි සිදු කරනු ලබන බලපෑම අතිමහත් ය. ඔහුට අනුව සන්නිවේදනය හරහා ගුරුවරයා සහ සිසුවා අතර සක්‍රීය සම්බන්ධතාවක් ගොඩනැගෙන අතර එය සිසුවාට පමණක් නොව ගුරුවරයාට ද යමක් ඉගෙනීමට සලසනු ලබයි. දෙපාර්ශ්වය අතරම දන්නා සහ නොදන්නා කරුණු සාකච්ඡාවට භාජනය වීම මත මෙය සිදුවනු ලබයි. එසේ ම ඔහු දක්වා සිටින්නේ මේ හරහා සංවර්ධනය වන කුසලතා සන්නිවේදන කුසලතා ප්‍රවර්ධනය සඳහා ම පමණක් සීමා නොවන අතර ඒ හරහා එකිනෙකා කෙරෙහි ගෞරවය දැක්වීම සහ සහයෝගීතාවය වැනි කුසලතා ද සංවර්ධනය වන බව ය. මෙම සංවාදයන් ගුරු-සිසු සහ සිසු-සිසු අතර ද ගොඩනැංවීම මෙහිදී වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

එසේ ම ෆ්‍රෙයර් (1970) දක්වා සිටින්නේ සංවාදය හුදෙක් වචන හුවමාරුක් ලෙස පමණක් නොව එය විවේචනාත්මක චින්තනය වැඩිදියුණු කරන අන්‍යෝන්‍ය මානව සම්බන්ධතා ප්‍රවර්ධනය කරන සහ සමාජ පරිවර්තනයේ ප්‍රධාන සාධකයක් වශයෙන් ද ක්‍රියා කළ යුතු බව ය. එසේ ම සංවාදය තවත් අර්ථවත් වීමට නම් එය අන්‍යෝන්‍ය ගෞරවය සහ සමානාත්මතාවය මත ද පදනම් විය යුතු බව දක්වා ඇත. මොහු පුද්ගල සාක්ෂරතා ප්‍රවර්ධන වැඩසටහන් බොහොමයක්

සිදුකොට ඇති අතර එහිදී ඔහු සංවාදය යන සාධකය මූලික මෙවලමක් ලෙස යොදාගෙන ඇත. නිදසුනක් ලෙස 1980 වර්ෂයේ පීඩනය සහ සමාජ වෙනස පිළිබඳ විවේචනාත්මක සාකච්ඡා ඔස්සේ සිදුකරන ලද කියවීම සහ ලිවීම ඉගැන්වීම සඳහා ''The National Literacy Crusade'' වැඩසටහනේ දී සංවාද පාදක අධ්‍යාපනය භාවිතා කර ඇත (ආර්නෝව්, 1981). එසේ ම දකුණු අප්‍රිකානු වර්ණ භේද විරෝධී වැඩසටහන්වල (South African Anti-Apartheid Education Program) ක්‍රියාකාරී සාමාජිකයන් විසින් ජාතිවාදය, යටත් විජිතවාදය සහ ප්‍රතිරෝධී උපායමාර්ග සාකච්ඡා කිරීමේදී ෆ්‍රෙයර්ගේ සංවාද පාදක ඉගෙනුම් ක්‍රම භාවිතා කිරීම සමකාලීන නිදසුනකි (ගිබ්සන්, 2004). ෆ්‍රෙයර්ගේ මෙම හඳුන්වාදීම වසර ගණනක් දුරාතීතයකට හිමිකම් කීව ද වත්මන් අධ්‍යාපන රටාවට තවමත් යොදා ගත හැකි ලෙස පවතිනු ලබයි.

විසි එක්වන සියවසේ අධ්‍යාපනය තුළ එන සාමූහික ඉගැන්වීම ප්‍රවර්ධනයට මූලිකවම බලපාන සංවාද පාදක ඉගෙනුම ඊට පමණක් ම සීමා නොවී තවත් බොහොමයක් කුසලතා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ පෝෂණය කිරීමට උපකාරී වනු ලබයි.

**ක්‍රියාව**

සැබෑ අධ්‍යාපනය වනාහි දැනුම ලබා ගැනීම පමණක් නොව එම දැනුමේ සැබෑ වෙනසක් ඇති කිරීම සඳහා එය ප්‍රායෝගිකව භාවිතයට, ක්‍රියාවට නැගීමක් බව ෆ්‍රෙයර් විසින් තර්ක කර ඇත. ඔහු විසින් ක්‍රියාව නොහොත් මෙම ''ෆ්‍රැක්සිස්'' යන්න නිර්වචනය කරනු ලබන්නේ එය ලෝකය පරිවර්තනය කිරීම සඳහා සිදුකරනු ලබන පරාවර්තනය සහ ක්‍රියාමාර්ග යන්න ය (ෆ්‍රෙයර්, 1970). මෙමගින් අදහස් කරන්නේ ඉගෙනගන්නන් විසින් පළමුව ඔවුන්ගේ සමාජ යථාර්ථය පිළිබඳ ගැඹුරු අවබෝධයක් වර්ධනය කරගත යුතු බවත් පසුව එම යථාර්ථය තුළ පවතින අසාධාරණ තත්ත්වයන් හඳුනාගෙන ඒවා වෙනස් කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු බවත් ය. එනම් ශිෂ්‍යයා හුදෙක් තමා පිළිබඳ, සමාජ වටපිටාව සහ අභියෝගයන් පිළිබඳ දැනුම ලබා ගැනීම හෝ දැනුවත් වීම පමණක් ප්‍රමාණවත් නොවන බවත් ඒවා සම්බන්ධ දැනුම ලබාගෙන ඒවා

ප්‍රායෝගිකව ක්‍රියාවට නැන්වීම සැබෑ අධ්‍යාපනය ලෙස ෆ්‍රෙයර් තම අධ්‍යාපන දර්ශනය හරහා හඳුන්වා දී ඇත. එය පහත පරිදි දැක්විය හැකි ය.

| පරාවර්තනය (Reflection) |
|---|
| සිසුන් ඔවුන්ට මුහුණ දීමට සිදුව ඇති ජීවන අත්දැකීම් විශ්ලේෂණය කරමින් එහි පවතින පීඩාකාරී අවස්ථා හඳුනා ගැනීම සහ ඒ පිළිබඳව දැනුවත් වීම |

↓

| ක්‍රියාව (Action) |
|---|
| එම දැනුවත්භාවය මත පදනම්ව සමාජ ව්‍යාපාර, සමාජ ක්‍රියාකාරීත්වයන් හෝ ප්‍රජා සහභාගිත්වය හරහා එම පීඩාකාරී අවස්ථා වෙනස් කිරීමට උත්සාහ ගැනීම. |

ෆ්‍රෙයර්ගේ මෙම ක්‍රමය, අධ්‍යාපනය තුළ පමණක් නොව විප්ලවවාදී ව්‍යාපාරවල ද බහුලව භාවිතා වී ඇත (ආර්නෝව්,1981). එහි දී ඔහු සඳහන් කර ඇත්තේ පද්ධතිය තුළ සැබෑ වෙනසක් ඇති කිරීමට නම් එය තනිවම කළ නොහැකි බවත් ඒ සඳහා සාමූහික සංවිධානයක් අවශ්‍ය බවත් ය. රයිට් සහ බුල්ෆර්ඩ් (2003) ට අනුව බ්‍රසීලියානු සමාජ ව්‍යාපාරයක් වන BLW (Brazilian Landless Workers) විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ සඳහා පෙනී සිටින ග්‍රාමීය පාසල් හා ප්‍රජා සාකච්ඡා වැඩසටහන්වල දී ෆ්‍රෙයර්ගේ මෙම ඉගැන්වීම් යොදාගෙන ඇත. එහිදී ගොවීන් තම නීතිමය අයිතිවාසිකම් සම්බන්ධව ඉගෙන ගැනීම පමණක් නොව තම අයිතිවාසිකම් වෙනුවෙන් හඬ නැගීම සඳහා විරෝධතා සංවිධානය කිරීමට සේම ඒ සම්බන්ධව රජයෙන් ඉල්ලා සිටීම් සිදුකිරීමට ද කටයුතු කර ඇත. ඒ අනුව හුදෙක් දැනුම පමණක් ලබා ගැනීම ප්‍රමාණවත් නොවන බවත් සැබෑ වෙනසක් කරා යාමට නම් තම සමාජ ජීවිතය යහ පරිදි වෙනස් කර ගැනීමටත් නම් එම දැනුම ක්‍රියාවට නැංවිය යුතු බව මෙහිදී අවධාරණය කර ඇත.

21 වන සියවසේ අධ්‍යාපනය පිළිබඳ සාකච්ඡාවේ දී මෙම ප්‍රවේශය ප්‍රායෝගික ඉගෙනුම හා සම්බන්ධ වේ.

## අධ්‍යාපනයේ බැංකු ආකෘතිය **(Banking Model in Education)**

ෆ්‍රෙයර් සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රම දැඩිව විවේචනයට ලක් කරන ලද අධ්‍යාපන දාර්ශනිකයෙකි. එම සංදර්භය තුළ දී සිසුන් ඉගෙනීමේ ක්‍රියාකාරී සහභාගී වන්නන් ලෙස නොව නිෂ්ක්‍රීය දැනුම ලබන්නන් ලෙස හැසිරෙන බව පෙන්වා දී ඇත. ඒ අනුව මෙම සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් රාමුව ෆ්‍රෙයර් විසින් ''අධ්‍යාපනයේ බැංකු ආකෘතිය'' යන විශේෂ නමින් හැඳින්වීය. එසේ ම මෙම සන්දර්භය තුළ දී ගුරුවරයා ප්‍රජාතන්ත්‍රවාදී බවින් බැහැර වූ අධිකාරිමය පාලන ප්‍රවේශයක් හසුරුවන, බලය යන සාධකය මුදුන් පමුණුවාගත් චරිතයක් හසුරුවන බවද පෙන්වා දී ඇත. එහිදී ගුරුවරුන් තම දැනුම තැන්පත් කළ යුතු හිස් භාජන ලෙස තම සිසුන් දකින බවත් ඔවුන් දැනුමේ එකම හිමිකරුවන් ලෙස සිතා සිටින බවත් ෆ්‍රෙයර්ගේ දර්ශනය තුළ සඳහන් වේ. මෙම අදහස පහත පරිදි නිරූපණය කළ හැක.




ඒ අනුව අධ්‍යාපනය සාම්ප්‍රදායිකත්වය නොහොත් මෙම බැංකු ආකෘතියට අනුව ගුරුවරයා හා ශිෂ්‍යයා අතර ඇත්තේ සිරස් සම්බන්ධතාවකි.




ෆ්‍රෙයර් (1970) ට අනුව, බැංකු ආකෘතිය තුළ දැකගත හැකි ප්‍රධාන ලක්ෂණ කීපයකි.

1. නිෂ්ක්‍රීය ඉගෙනුම ලබන්නන් - බැංකුවේ මුදල් තැන්පත් කරන ආකාරයටම සිසුන් තුළ දැනුම තැන්පත් කිරීම
2. විවේචනාත්මක චින්තනයට මුල්තැන නොදෙන කටපාඩම් කිරීමේ ශෛලිය - ප්‍රශ්න කිරීමකින් හෝ විශ්ලේෂණයකින් තොරව දැනුම සහ තොරතුරු කටපාඩම් කිරීම ඔස්සේ නැවත ලබා ගැනීම
3. පවතින එකම අධිකාරිය ලෙස ගුරු භූමිකාව - සිසුන් නිහඬව සහ කීකරුව සිටියදී ගුරුවරයා විසින් අවශ්‍ය උපදෙස් ලබා දීම හා දැනුම ලබාදීම
4. පීඩාකාරී බව
5. සාම්ප්‍රදායික දේශන ඉගැන්වීම් ක්‍රමය
6. මතකය තක්සේරු කරන විභාග ක්‍රම
7. විධිමත් ආදානයක් හෝ ප්‍රතිදානයක් නොමැති දැඩි විෂය මාලාව
8. අධිකාරිවාදී පන්ති කාමර කළමනාකරණය - ශිෂ්‍යයාට ප්‍රශ්න කිරීමට ඉඩ නොදෙන පංති කාමරය

අධ්‍යාපනයේ සැබෑ ප්‍රතිඵල ලැබීමට නම් ඉගෙනුම ලබන්නාගේ සේම ඉගැන්වීම සිදුකරන්නාගේ ද භූමිකාව නිවැරදි විය යුතු ය. නමුත් සිසුවාට ගැළපෙන විෂය මාලාවක් නොමැති, ඉගැන්වීම් පරිසරයක් නොමැති සහ විධිමත් ඉගැන්වීම් ක්‍රම නොමැති සංදර්භයක් තුළ සැබෑ අධ්‍යාපනයක් සිදුවන්නේ ද යන්න සිතීම පවා බැරෑරුම් සහගත ය. ඕර්න්ස්ටයින් සහ හන්කින්ස් (2018) දක්වා ඇති පරිදි සාම්ප්‍රදායික අධ්‍යාපනය වනාහි ව්‍යුහගත ගුරු කේන්ද්‍රීය ප්‍රවේශයක් වන අතර එය

ගුරුවරයා විසින් ශිෂ්‍යයා වෙත ලබාදෙන සෘජු උපදෙස් සහිත ප්‍රමිතිගත විෂය මාලාවක් සහ කටපාඩම් කිරීම මත පදනම් වූ තක්සේරුව හරහා දැනුම සම්ප්‍රේෂණය වන්නක් බව දක්වා ඇත. එසේ ම අයිස්නර් (2002) ට අනුව මෙම සංදර්භය තුළ සිසුන්ගේ නිර්මාණශීලීත්වය සහ විචාරශීලි චින්තනය ද සීමා කරනු ලබයි. ෆ්‍රෙයර් තම බැංකු ආකෘතිය හරහා පෙන්වා දී ඇත්තේ මෙම සමස්ත කරුණුවල විග්‍රහයකි. එය අධ්‍යාපනයට කොතරම් බලපෑම් කරන්නේ ද යන්න ඔහු විසින් දක්වා ඇත. ඒ අනුව මෙම ක්‍රමය වෙනුවට ඔහු තම දාර්ශනික අදහස් හරහා ගැටලු මතු කරන අධ්‍යාපන ප්‍රවේශය හඳුන්වා දී ඇත.

## ගැටලු මතු කරන අධ්‍යාපනය (Problem Posing Education)

බැංකු ආකෘතික ඉගෙනුම් ප්‍රවේශයට විකල්පයක් වශයෙන් ෆ්‍රෙයර් මෙම ප්‍රවේශය යෝජනා කර ඇත. මෙය සංවාදාත්මක, සහභාගිත්ව සහ විවේචනාත්මක චින්තනය වැඩිදියුණු කරන ඉගෙනුම් ප්‍රවේශයකි. මෙම ප්‍රවේශය හරහා,

- විවේචනාත්මක චින්තනය වැඩි දියුණු කිරීම - ප්‍රශ්න කිරීමට, ගැටලු විසඳීමට, තොරතුරු විශ්ලේෂණයට සිසුන් දිරිමත් කරනු ලබයි.
- සංවාද පාදක ඉගෙනුම - ගුරුවරයා හා සිසුන් තම දැනුම හුවමාරු කර ගනිමින් මනා සන්නිවේදනයක් කරා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත ලබයි.
- අධ්‍යාපන සමාජ යථාර්ථය සමඟ බද්ධ වීම - ඉගෙනුම ලබන කරුණු සැබෑ ලෝකය හා සම්බන්ධවීම සහ සැබෑ ලෝකයේ ගැටලුවලට පිළියම් සෙවීමට සිසුන්ව පෙළඹවීම
- කරුණු කටපාඩම් කිරීම වෙනුවට සාකච්ඡා සහ විවාද කවවල නිරත වීම
- ව්‍යාපෘති පාදක ඉගෙනුම (PBL) ප්‍රවර්ධනය

යන ලක්ෂණ ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකි ය. ඒ අනුව, ගීරුක්ස් (2011) දක්වා ඇත්තේ ද ගැටලු මතු කරන අධ්‍යාපනය වනාහි සාම්ප්‍රදායික අධ්‍යාපනයේ අධිකාරිවාදී ව්‍යුහයට අභියෝග

කරන ඉගෙනුම් ප්‍රවේශයක් බවයි. මෙහිදී සිසුන් විසින් ප්‍රශ්න කිරීමට, සාකච්ඡා කිරීමට සහ සැබෑ ලෝකයේ ගැටලු සමඟ සම්බන්ධ වීමෙන් ඔවුන් ඉගෙනුම් ක්‍රියාවලියක ක්‍රියාකාරී සහභාගී වන්නන් වන බව ද ඔහු විසින් තවදුරටත් පෙන්වා දී ඇත.

මේ අනුව සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමය තුළ පවතින ගුරුවරයා හා ශිෂ්‍යයා අතර පවතින සිරස් සබඳතාව ෆ්‍රෙයර්ගේ විසිඑක්වන සියවසේ කුසලතා ප්‍රවර්ධනය කරන ඉගෙනුම් ක්‍රමවලදී එය තිරස් සබඳතාවක් බවට පත් වේ.




මෙම සන්දර්භයේ දී දෙපාර්ශ්වයේ ම සක්‍රීය සහභාගිත්වය සහිතව එකිනෙකාට විවෘත වී මනා සන්නිවේදනයකින් ක්‍රියා කරනු ලබයි. එසේ ම කිසිවෙකු කිසිවෙකුට වඩා ඉහළින් නොසිටින අතර අන්‍යෝන්‍ය ගෞරවය මත රඳා පවතින එකිනෙකාගේ ප්‍රවීණත්වය ලබා ගනී. ඒ අනුව සමස්ත ඉගෙනුම්

ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රජාතන්ත්‍රවාදී පරිසරයක් මත ක්‍රියාත්මක වේ.

**නිගමනය**

විසි එක්වන සියවසේ අධ්‍යාපනය තුළ හමුවන නූතන බටහිර දාර්ශනිකයන් අතර වඩාත්ම බලගතු යැයි සැලකෙන පවුලෝ ෆ්‍රෙයර්, අධ්‍යාපනය තවත් සියවස් ගණනාවකට උචිත පරිදි වෙනස් කිරීමට ප්‍රයත්න දැරුවෙකි. එදා සමාජයේ සේම අදටත් හෙටටත් මහෝපකාරී වන විචාරශීලී චින්තනය වැනි ප්‍රධාන ගණයේ කුසලතාවන් මූලික කර ගනිමින් ඔහු තම අධ්‍යාපන මාර්ගය එළිදක්වා ඇත. සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමයේ පවතින සෘණාත්මක පැතිකඩ දැඩි ලෙස විවේචනයට ලක් කළා පමණක් නොව ඒ වෙනුවට තම දෘෂ්ටිකෝණය ඔස්සේ වඩාත් ඵලදායි විසඳුම් ද යෝජනා කරනු ලැබූවෙකි. මේ අනුව අධ්‍යාපනයේ සැබෑ ප්‍රතිඵල ලැබීමට නම් ගුරුවරයා, ශිෂ්‍යයා පමණක් නොව සියලුම අධ්‍යාපන පාර්ශ්වකරුවන්ද ක්‍රියා කළ යුත්තේ කෙසේද යන්න පැහැදිලිව අවධාරණය කර දුන් අධ්‍යාපනඥයකු ලෙස පවුලෝ ෆ්‍රෙයර් පෙන්වා දිය හැක.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

Arnove, R. (1981). *Education and revolution in Nicaragua*. Praeger.

Darder, A. (2018). *The student guide to Freire's Pedagogy of the Oppressed. Bloomsbury*.

Freire, P. (1968). *Pedagogy of the oppressed*. Continuum.

Freire, P. (1970). *Pedagogy of the oppressed*. Continuum.

Freire, P. (1994). *Pedagogy of hope: Reliving Pedagogy of the Oppressed*. Continuum.

Freire, P., & Macedo, D. (1987). *Literacy: Reading the word and the world*. Bergin & Garvey.

Gibson, N. (2004). *Fanonian practices in South Africa: From Steve Biko to Abahlali base Mjondolo*. Palgrave Macmillan.

Giroux, H. A. (1988). T*eachers as intellectuals: Toward a critical pedagogy of learning*. Bergin & Garvey.

Gutiérrez, G. (1973). *A theology of liberation*. Orbis Books.

Klein, H. (2015). *Compañeras: Zapatista women's stories*. Seven Stories Press.

Klein, N. (2015). *This changes everything: Capitalism vs. the climate*. Simon & Schuster.

Shor, I. (1992). *Empowering education: Critical teaching for social change*. University of Chicago Press.

Torres, C. A. (1993). From the pedagogy of the oppressed to A Luta Continua: The political pedagogy of Paulo Freire. In P. McLaren & P. Leonard (Eds.), Paulo Freire: A critical encounter (pp. 119-145). Routledge.

Torres, C. A. (1993). From the pedagogy of the oppressed to A Luta Continua. Harvard Educational Review, 63(2), 175-205. https://doi.org/xxxxx

Torres, C. A. (2014). *First Freire: Early writings in social justice education*. Teachers College Press.

Wainwright, H. (2012). Reclaim the state: Experiments in popular democracy. Verso.

Wright, A., & Wolford, W. (2003). To inherit the Earth: The Landless Movement and the struggle for a new Brazil. Food First Books.

World Health Organization. (n.d.). WHO homepage. Retrieved March 10, 2025, from https://www.who.int

Nelson Mandela Foundation. (n.d.). Nelson Mandela Foundation homepage. Retrieved March 10, 2025, from https://www.nelsonmandela.org